අද
සඳුදා
2014-10-20

# මාලබේ වෛද්‍ය විද්‍යාලය වසා දමන ලෙස වෛද්‍යවරු 15000කගේ අත්සනින් ජනපතිට පෙත්සමක්

■ **එච්.අයි. තුෂාර**

මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වසා දමන ලෙස ඉල්ලා වෛද්‍යවරුන් 15,000 කගේ අත්සනින් යුතු පෙත්සමක් ජනාධිපතිවරයාට භාරදෙන බවත්, පෙත්සම අත්සන් කිරීම අද (20දා) සිට ආරම්භ කරන බවත් සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සඳහන් කරයි.

මෙම පෙත්සම ඉදිරිපත් කරමින් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වසා දමා රටේ දරුවන්ගෙන් පිරිසක් රැවටීමකට ලක්කළ මාලබේ වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ඉල්ලා සිටින බවද එම සංගමයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වෛද්‍ය අසංග වික්‍රමසිංහ මහතා සඳහන් කළේය.



ඉදිරි සති දෙක තුළදී අත්සන් ලබාගැනීම අවසන් කර ජනාධිපතිවරයාට මෙම පෙත්සම භාරදීමට අමතරව මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වසා දමන ලෙසට ඉල්ලා සමස්ත සෞඛ්‍ය වෘත්තිකයන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හා පොදු මහජනතාව එක්ව උද්ඝෝෂණ ව්‍යාපාර පවත්වන බවද හෙතෙම පවසා සිටියේය.

Full Screen